
ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

# ළමා ප්‍රදීපය

ක්‍රි. ව. 2012 අප්‍රේල් 02 සඳුදා
04 වෙළුම - 24 කලඹ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු. 10.00

විශේෂ පාස්කු කලාපය



## ජේසුස් වහන්සේ මරණයෙන් උත්ථානය වීම

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - **2695984 / 4899611**
ෆැක්ස් : 2692586 - ඊ-මේල් **pradeepaya@yahoo.com**
වෙබ් අඩවිය - **www.colombocatholicpress.lk**

# උත්ථානයේ ජනතාවක් වන්නට පුංචි ඔබට ආරාධනා.

**ආදරණීය දුවේ පුතේ...**

ඉමහත් ධර්ම වටිනාකමක් හා විශ්වාසයේ හර පද්ධතිය කැටි කරන, එලෙසම අගනා කිතුනු ජීවිත පැවැත්මේ පදනම පිළිබඳව සම්පූර්ණයෙන්ම පවසාලන පාස්කු සමය ඇරඹුනා. ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම හා මරණය තුළින් ගෙන ආ ගැලවීමේ මහා සම්පූර්ණ ක්‍රියාවලිය ජීවනයේ අගනාම සංකේතය බවට පත්වන්නේ ඔවුන්වහන්සේගේ උත්ථානය තුළින් බව අපි මනාව වටහා ගන්නට ඕනා. අපේ කිතුනු බවේ සැබෑ වටිනාකම ගැබ් වන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය තුළයි. අපි උත්ථානයේ ජනතාවක්. තව දුරටත් වැළපෙන , දුක්වෙන , කඳුළු හලන , විලාප නඟන ජනතාවක් සේ අපිට ජීවත් වන්නට බැහැ. පාප අන්ධකාරයේ තව දුරටත් ඇලී ගැලී ජීවත් වන්න අපට බැහැ.

ආදර දුවේ පුතේ,

ක්‍රිස්තුන් වහන්සේ මිනිස් අපගේ දුර්වල පැවැත්මයි, තමන් වහන්සේ වෙතට පවරා ගත්තේ. ඒ පාපය දුරස් කරලා, අන්ධකාරය ඉවත් කරලා, පිරිපුන් බවකින් කිතුනු ජීවිතය භාරගන්නට හා එහි උරුමය පවසන්නට උත්ථානයේ සමිඳුන් පුංචි ඔබට ආරාධනා කරනවා. උත්ථානයේ ජනතාවක් හැටියට ජයග්‍රාහී කුරුසියේ පහස ලබන ඔබ, ඔබේ කිතුනු විශ්වාසයට අවංක වන්නට ඕනා. එහි සාක්ෂි කරුවන් බවට පත් වෙන්න ඕනා. ඒ පණිවිඩය ජීවත් කරවන ජීවමාන සංකේත බවට පත් වෙන්න ඕනා.

ක්‍රිස්තුන් වහන්සේ මරණයෙන් තුන් දිනකට පසු ඒ මරණය පරාජය කලා. පාපය පරාජය කලා. අජරාමරව උත්ථානයේ මහා සම්මත පණිවුඩය තුළින් හමා ආ ශුද්ධාත්ම ජීවනාලිය තුළ කිතුනු අපට සැඟවී ජීවත් වන්න බැහැ. ප්‍රේමයේ උතුම් පණිවුඩයක් ගෙන ආ උත්ථානයේ සැබෑ සත්‍යතාවය තුළ අපි කිතුනුවන් බවට පත් වූ සේම ඉදිරියට යන ධෛර්ය සම්පන්න කිතුනුවන් සේ සුවිශේෂී වටිනාකම් වලටත් අවනත වන්නට අවශ්‍යයයි. ඒ අවනත වීම තුළ සමස්ත ශුද්ධවූ සභාව ජීව හුස්ම හෙලනවා. වසර දෙදහස් දහයකට අධික කාලයක් තුළ හමා ආවේ ඒ ජීව හුස්ම තුළ පණ ගැන්වූ සීල සුවඳයි.

ශුද්ධවූ සභාවේ ප්‍රාණ පරිත්‍යාග ශිලිවරුන් බිහිවන්නට , සත්‍ය දහමට ජීවිතය පුද කිරීම තුළින් සාක්ෂය දරන්නන් බිහිවීමට, සමස්ත සාන්තුවර දැක්මේ ක්‍රිස්තු අනුගාමිකයන් බිහිවන්නට මුලික වුයේ මේ උත්ථානයේ පණිවුඩයයි.

මරණය වැළඳගත් ජනතාවකට හා අන්ධකාරයේ ගමන් කරන ජනතාවකට මේ ආලෝකයේ , ජීවනයේ උත්ථාන පණිවුඩය තේරුම් ගන්නට අපහසුයි. ඒ නිසා ඔබ අන්ධකාරයේ මාවත තුළ ගමන් කරන දරුවන් නොව ආලෝකයේ ජයග්‍රහී මාවත තුළ ගමන් කරන දරුවන් බව නිරන්තරයෙන්ම අවබෝධ ගන්න ඕනා. ඒ පැවැත්මට සම්පූර්ණයෙන්ම සම්බන්ධ වෙන්න ඕනා.

කිතු සමිඳුන් ලොවට ගෙනා ඒ උතුම් සුවිශේෂී වටිනාකම් ක්‍රිස්තු දැක්මෙන් විහිඳ හරින්නට අපට බලය ලැබෙන්නේ උත්ථානයේ ජීව ශක්තියෙන්මයි. ඒ ශක්තිය තුළයි, එදා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රාවකයන් නොබියව ගමන් කළේ. අන්‍ය ජාතිකයන් වෙතට ගමන් කරන්නට ඔවුනට සම්පූර්ණ ශක්තිය ලැබුණේ මේ උත්ථානයේ බල මහිමයෙන්මයි. එම නිසා ආදර දුවේ පුතේ, අද මේ දේශයේ අනාගතය භාර ගන්න ඉන්න ඔබ හැම දෙනාම ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයේ පණිවුඩය තුළින් ධෛර්යමත් ළමා පරපුරක් බවට පත් වීම අත්‍යවශ්‍යයයි. ජීවිත හැඩ ගැස්මෙන් හා වටිනා කම් හරයාත්මකව ජීවිතයේ වර්ධනය කර ගැනීමෙන් සුවිශේෂී දහම් පණිවුඩයේ වාහකයන් බවට පත් වීම අත්‍යවශ්‍යයයි. තවත් ක්‍රිස්තුවරයෙක් වෙමින් ඒ සුබාරංචිය තවත් ජනතාවක් වෙත ගෙන යන පණිවුඩකරුවන් වීම අත්‍යවශ්‍යයයි.

දේව රාජයේ සැබෑ සළකුණු හඳුනාගෙන ඒ අනුව ජීවත් වෙමින් මරණය ජයගත් අප සමිඳාණන්ගේ උතුම් පහස තුළ උත්ථානයේ දරු පරපුරක් සේ ගමන් කරන්නටයි, ඔබට කරන මේ ආරාධනා !

**පුංචි ඔබ සැමට සුබ පාස්කු මංගල්‍යයක් වේවා !**

ඔබ සැමට ජේසු පිහිටයි !

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# දේව ආදරයේ පහස ලබමු



එකතරා ගමක කුඩා පවුලක් විය. පියා, මව, සහ ඔවුන්ගේ එකම කුඩා පුතුගෙන් මේ පවුල සමන්විත විය. පියා තම බිරිඳට සහ පුතුට බොහෝසේ ආදරය කළා. මේ පියාගේ එකම වරදක් ලෙස දක්නට තිබුනේ ඉක්මනින් කේන්තියාමයි.

දිනක් පියා තම මෝටර් රථයේ අළුත් වැඩියා කටයුත්තක් කරමින සිටියේය. එවිට තම සිව්හැවරිදි පුතු රථයේ කුරුටු ගාමින් සිටිනු පියාගේ නෙත ගැටිනි. මේ දුටු පියාට ඉවසීමේ සීමා නැති විය. ඔහු තම අතට හසුවූ දෙයින් තම දරුවාගේ දෑතට දැඩි ලෙස පහර දෙන්නට විය. පහරදී ඇත්තේ වාහනයේ අළුත් වැඩියා කිරීමට යොදාගත් ආයුධයකින් බව ඔහු වටහා ගත්තේ පසුවය. පහර කෑමට ලක්වූ දරුවා රෝහල් ගත කෙරිණි.

එහිදි වෛද්‍යවරුන් පවසා සිටියේ දරුවාගේ ඇඟිලි ඉවත් කිරීමට සිදුව ඇති බවයි. පසුව පියා දරුවා බැලීමට රෝහලට පැමිණියහ. එහිදි එම කුඩා පුතු ඇසූ ප්‍රශ්ණයකින් පියාගේ හදවත කිරී ගැහෙන්නට විය. එනම්, ''තාත්තේ, මගේ ඇඟිලි වැඩෙන්න ගොඩක් කල් යයිද?'' යන්නයි. ඒ මොහොතේ පියාට බොහෝ දුකක් දැනුනි. ඔහු වාවා ගත නොහැකි වේදනාවකින් සිය නිවසට පැමිණ තම මෝටර් රථයට වැරෙන් පහර දෙන්නට විය. එවිට තම පුතු මෝටර් රථයේ කුරුටු ගා තිබුනේ කුමක්දැයි ඔහුගේ නෙත ගැටිනි. එනම්, ''මම තාත්තට ආදරෙයි'' යන්නයි. මෙම දසුන දැකීමෙන් පියාට දුක වාවා ගත නොහැකි විය. දුකදරාගැනීමට නොහැකි වූ පියා පසුදින සිය දිවි නසාගත්තේය.

වෙන්න ඇති. ඒත් මේ පියාට තිබුණේ එකම දුර්වකමයි. එයමයි ඔවුන්ගේ පවුලට අවාසනාව ගෙනා ආවේ, එය තමයි ඉක්මන් කෝපය. පියාගේ ඉක්මන් කෝපය නිසා එම කුඩා දරුවාගේ ඇඟිලි අහිමි වුනා. පියා මෙම

තරහට සහ ආදරයට සීමාවක් නැත. මෙම කථා පුවතේද දරුවාගේ ආදරයටත් පියාගේ කේන්තියටත් සීමාවක් නැත. එබැවින් ඔවුන්ව අවාසනාවන්ත අවසානයකට ගෙන ගියේද එයමය.

මේ තුළ ඉතා වැදගත් මෙන්ම වටිනා පණිවිඩයක් ගැබ්වී තිබෙනවා. ආදරය, කරුණාව, තරහව සහ මනස්ථාපනය. මේ සෑම ගුණයක්ම තිබෙන්නේ මිනිස් හදවත තුළයි. අපට මේ කථාන්දරයේදීත් එය ඉතා පැහැදිලියි. මේ කතාවේ එන පියා තම දරුවට අසීමිත ලෙස ආදරය කළා, මන්දයත් ඒ ඔවුන්ට සිටි එකම පුතා නිසා දරුවාට ගොඩක් ආදරය කළ නිසා ඔහුට එය දරා ගැනීමට නොහැකි වුවා. එම මොහොතේදී තමයි පියා මනස්ථාපනය වුයේ. එය යහපත්. එහෙත් ඔහු මනස්ථාපනය වී ක්‍රියා කළේ කෙසේද? ඔහු සිය ජීවිතය නැති කර ගත්තා. ඔහුට ඔහුගේ වරදේ බරපතලකම තේරුම් ගන්නට සිතක් තිබුණ නමුත් එයට නිසි ආකාරව ප්‍රතික්‍රියා කිරීමට ධෛර්යයක් තිබුණේ නෑ.

මෙම සිද්ධියට සමාන සිද්ධියක් අපට සුභාරංචිය තුළද දැක ගන්නට පුළුවන්. ස්වාමින් වහන්සේ සමඟ එකට සිටි ගෝලයන්වූ පේදුරු සහ ජුදාස් උන් වහන්සේට විරුද්ධ වුවා. පේදුරු ස්වාමින් වහන්සේව ප්‍රතික්ෂේප කළා. එමෙන්ම ජුදාස් ස්වාමින් වහන්සේව පාවා දුන්නා. පසුව ඔවුන්ට ඔවුන්ගේ වැරදි වැටහී මනස්ථාපනය වුවා, එත් දෙආකාරයකට. පේදුරු තුමා පසුතැවී ඔහුගේ වරද තේරුම් ගෙන නැවත ස්වාමින් වහන්සේගේ ආදරය පිළිගනු ලැබුවා. එම නිසා ඔහු ස්වාමින් වහන්සේ තුළ නව ජීවිතයක් හිමි කර ගනු ලැබුවා. එහෙත් ජුදාස් ක්‍රියා කරන්නේ ඊට ඉතා හාත්පසින් වෙනස් ආකාරයකටයි. එනම් ඔහුට තම පාපය තේරුම් ගැනීමට හැකි වුවත් ස්වාමින් වහන්සේගේ සමාව, ආදරය නැවත පිළිගැනීමට ශක්තිමත් සිතක් තිබුණේ නැහැ. මෙහිදි ජුදාස් ක්‍රියා කරන්නේද ඉහත කථාවේ පියාගේ චරිතයට සමාන ආකාරයකින්. ඔවුන් දෙදෙනාටම තම වරදවල් තේරුම් ගැනීමට ශක්තිය තිබුණද ඒවා නිවැරදි කර ගැනිමට අපොහොසත් වුවා.


ස්වාමින් වහන්සේ තුළ සැබෑ මනස්ථාපනයක් වී නව ජීවිතයක් අරඹමුද?එදා පේදුරු තුමා ස්වාමින් වහන්සේ ඉදිරියේ තම දුර්වලකම පිළිගත්තා සේ අපත් අප ආදර ස්වාමින් වහන්සේ ඉදිරියේ අපගේ දුබලකම් පිළිගෙන නව ජීවිතයකට ඇතුලු වෙමු. අප මනස්ථාපන විය යුත්තේ බාහිරින් නොව ඇතුලාන්තයෙන්ය. අප ආදර දෙව්පියා, අපගේ සිත් හැරි නැවත, උන්වහන්සේට අයිති එකදු දරුවකු හෝ නැති කර ගැනීමට අකමැති, තම දරුවන්ට අසීමිතව ආදරය කරන සෙනෙහෙබර පියකු වන බැවිනි. එම නිසා මෙවර පාස්කුවේදී සැබෑ වෙනසක් ඇති කරගෙන උන් වහන්සේගේ ඒ අසීමිත ආදරයට තුරුළු වෙමු.

**ඉග්නේෂියස් ඔස්වල්ඩ් ගුණවර්ධන**
ශු. ප්‍රැන්සිස් සේවියර්
**දේවිසත්හල - යාපනය.**

ළමා ප්‍රදීපය සිංහල අලුත් අවුරුදු කලාපය
අප්‍රේල් 09 වන දින (ලබන සතියේ) නිකුත් කෙරේ.....
පාස්කු සහ සිංහල අලුත්අවුරුද්ද නිමිත්තෙන් කොළඹ කතෝලික මුද්‍රණාලය වසා තැබෙන බැවින් අප්‍රේල් 16 වන දින ළමා ප්‍රදීපය පළ නොවන බැව් කරුණාවෙන් සළකන්න.
සංස්කාරක පියතුමා

# කොළොන්නාව දහම් දරුවෝ ප්‍රථම වතාවට දුක් ප්‍රාප්තිය රඟ දක්වති

ලංකා කතෝලික සභා ඉතිහාසය තුළ ජේසු සමිඳාණන්ගේ දුක්ප්‍රාප්තිය සිහිපත් කැරෙන පාස්කු නාට්‍ය කලාවට හිමිවන්නේ ඉතා සුවිශේෂී වූ ස්ථානයකි. එහිදී විශේෂ තැනක් හිමිවන කතෝලික ප්‍රදේශ ද ශ්‍රී ලංකාව තුළ පවතී. එහෙත් නගරබද ප්‍රදේශයන්හි පවතින මීසම්වල පාස්කු නාට්‍යය රඟ දැක්වීම සිදුවන්නේ ඉතාමත් අල්ප වශයෙනි.





කතෝලික ප්‍රදේශවල සුලබ දසුනක් වූ අප කතෝලික අනන්‍යතාවය මනාවට පෙන්නුම් කැරෙන, පැරැණි, වඩා වැදගත්කමින් යුතු වූ පාස්කු නාට්‍ය කලාවට සමගාමී වෙමින් නගරබද පෙදෙසකට අයත් කොළොන්නාව සා. ජෝශප් දේවස්ථානයේ දහම් පාසල් දරු දැරියන් විසින් වසරක් පාසා පවත්වනු ලබන පාද නමස්කාරය මෙවර ඉතා අර්ථවත් අන්දමින් නාට්‍යානුසාරයෙන් ස්ථාන මෙනෙහි කරමින් රඟ දැක්විණි.

ප්‍රථම වරට රඟ දැක්වීමක් සමඟ සිදුකළ මෙය මීසම් සේවක ගරු රුවන් රීඩ් පියතුමන්ගේ මඟ පෙන්වීමෙන්, දහම් ගුරුවර ගුරුවරියන්ගේ සංවිධානයෙන්, දහම් පාසල් දරු දැරියන්ගේ සහ දෙමාපියන්ගේ නොමඳ දායකත්වයෙන් යුතුව සිදු කෙරිණි.

**සටහන - ක්‍රිෂාන්ති පෙරේරා**
**සේයා - කේ. ජී. ප්‍රියන්ත**

# කළුතර දිසා පශ්චාත්තාපික ළමා දිනය

කළුතර දිසා ''පශ්චාත්තාපික ළමා දිනය'' පසුගිය ද මග්ගොන ජාතික කල්වාරි පුදබිමේදී පැවැත්වුණි. දිසාවේ මීසම් 9ක දහම් පාසල් දරු දැරියෝ රැසක් මීට සහභාගී වූහ. කළුතර දිසා දහම් පාසල් අධ්‍යක්ෂ, ගරු හේමන්ත උදය කුමාර පෙරේරා පියතුමන් ඇතුළු දිසා දහම් ගුරුවර ගුරුවරියෝ එක්ව මෙය සංවිධානය කළහ.



දිසාවේ ගරු පියතුමන්ලාගේ, කළුතර - පලාතොට ''දහම් සෙවනේ '' ගරු සහෝදරතුමන්ලාගේ සහ ධර්මදූත ළමා සමාජයේ ද සහය මේ සඳහා ලැබුණි. ළමුන් මෙයට සහභාගීවූ අයුරු සේයාරුවෙහි දිස්වේ.

**ඩී.ඇන්සලම් ප්‍රනාන්දු**

# මැද කොළඹ දිසා ධර්මදූත ළමා සමාජයේ පාද නමස්කාරය

මැද කොළඹ දිසාවට අයත් කොළොන්නාව, දෙමටගොඩ, සේදවත්ත, අලුත්කඩේ සහ බොරැල්ල මීසම්හි ධර්මදූත ළමා සමාජයේ දරු දැරියන් සහ සජීවක සජීවිකාවන් එක්ව වසරක් පාසා පවත්වනු ලබන පාද නමස්කාරය පසුගියදා අලුත්කඩේ සුබ මරණයේ අප ස්වාමි දූගේ දේවස්ථානයේදී සිදුකෙරිණි. මරදාන පාතිමා අප ස්වාමි දූ දේවස්ථානයේ මීසම් සහයක ගරු රන්දිල් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමන්ගේ සහ දිසා සම්බන්ධීකාරක ගරු ජූඩ් බෙහින් පියතුමන්ගේ මෙහෙයවීමෙන් සිදුකළ මෙම පාද නමස්කාර භක්ති අභ්‍යාසය සඳහා ධර්මදූත ළමා සමාජයන්හි දරු දැරියන් සියයකගේ පමණ දායකත්වය නොමඳව ලැබිණි. පාද නමස්කාරයෙන් පසු අගරදගුරු පදවි ධර්මදූත ළමා සමාජ අධ්‍යක්ෂ ගරු කිත්සිරි තිරිමාන්න පියතුමන්ගේ සහභාගීත්වයෙන් දරු දැරියන්ගෙන් පාපොච්චාරණය ඇසීම ද සිදු කෙරිණි.

**සටහන - ධ.ළ.ස. මැද කොළඹ දිසා කමිටුව**



# පොඩි ෆාදර් ලියයි

ගරු නිරංජන් විජේරත්න (සා. බෙ. නි.) පියතුමා

# ජේසු අපි හැමෝටම එකවගේ ආදරෙයි

ආදරණීය දුවේ පුතේ ඔබට මතක ඇති මම එක ලිපියකින් ඔබට ලිවුවා ඔබගේ ජීවිතයේ ජේසු නැතිවෙලා නම් හොයාගන්න කියලා. මේ චතාරික දින හතලිහ තිබෙන්නේ ඒකට, ඊට පස්සේ මම ඔයාලට පුංචි අභ්‍යාසයක් දුන්නා කරන්ට. යාච්ඤාව නිරාහාරය සහ දන්දීම හේතුකොට ගෙන කොහොමද නැතිවෙච්චදේ හොයාගන්නේ කියලා. මම හිතනවා ජේසුට ආදරේ ඇති ළමයි මේ අභ්‍යාසය කරලා ජේසු වෙතට වඩාත් ලංවෙන්න ඇති කියලා.

ආදරණීය දරුවනි, අපි දැන් ඇතුළුවන්නේ ශුද්ධවු සතියටයි. ගොබ් ඉරිදායින් ශුද්දවු සතිය ඇරඹෙනවා. ගොබ් ඉරිදා අපි සමරන්නේ ජේසුස් වහන්සේ රාජාශියෙන් ජෙරුසලමට වැඩම කිරීම. ඊට පස්සේ මහ බ්‍රහස්පතින්දා ජේසුස් වහන්සේගේ අන්තිම රාත්‍රී භෝජනය මෙදින තමයි උන්වහන්සේ ශුද්ධවු දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ සහ පුජාත්වරය නැමති සක්‍රමේන්තුව ස්ථාපිත කළේ. මෙදින අපි ඒ ඓතිහාසික සිදුවීම අනුස්මරණය කරනවා. විශේෂයෙන් පාද දෝවනය තුළින් මහ සිකුරාද අපි සිදුකරනු ලබන්නේ ඓතිහාසික ජේසුස් වහන්සේගේ මරණය මිසක් උන්වහන්සේගේ මලගම නොවේ. අද බොහෝ දෙනා මහ සිකුරාදා පල්ලි එන්නේ ජේසුස් වහ්සේ කුරුසියේ ඇණ ගසා මරලා භූමදන කරලා ගෙදර යන්න. ඒකයි කවදාවත් පල්ලි එන්නේ නැති මිනිස්සු එදාට පල්ලි එන්නේ. පාස්කු ඉරිදා ක්‍රිස්තුන් වහන්සේගේ ජයග්‍රාහී උත්ථානය සමරනු ලබනවා. අපට ඉන්නේ මැරුණු දෙවි කෙනෙක් නොවේ. මරණය පරාජය කරලා උත්ථානවු දෙවි කෙනෙක්. අවාසනාවනට වගේ අපි පාස්කු ඉරිදා එතරම් ගනන් ගන්නේ නැ. අපට නත්තලට වඩා වැදගත් විය යුත්තේ මේ දවසයි. ජේසුස් වහන්සේගේ උපතට වඩා උත්ථානය වැදගත්. අපි හරිනම් තුල් මනින්න ඕනේ මැරුණු ජේසුගේ සුරුවමේ නොවේ. උත්ථානවු ජේසුගේ සුරුවමෙයි. මේ දින තුනෙන්ම අපට දරුවනි ප්‍රකාශ වන්නේ ජේසුන් වහන්සේගේ අසීමිත ආදරයේ කමාවයි. මට හිතෙනවා ආදරණීය දරුවෙනි ජේසුගේ ආදරයත් මේ වගේ කියලා.



එක පොඩි ළමයකුට බොනික්කෝ පනහක් හිටියාලු දවසක් ඇයගේ මාමා ඇහුවලු ''දුව මෙයින් මොන බෝනික්කාටද වඩා කැමති කියලා'' එවිට අර ළමයා එකපාරටම අර කකුල් කැඩුනු කළු බොනික්කෙකුට ඇඟිල්ල දික් කලාලු. මාමා එවිට පුදුමයෙන් ඇහුවාලු මේ ළමයාගෙන් ''ඇයි දුවේ ඒ බෝනික්කාට ඔයා වැඩියෙන් කැමති කියා. ඊට පස්සේ පුංචි දුව ලස්සන උත්තරයක් දෙනවා. ''මාමේ බොනික්කාට ආදරය කරන්න කවුරුත් නැහැ. ලස්සන බොනික්කන්ට හැම දෙනාම කැමතියි. ඒ නිසා මම මේ බෝනික්කාට ආසයි කියලා.

ආදර දුවේ පුතේ, මේ පුංචි කතාවෙන් අපට පෙන්නන්නේ ජේසු අපි හැමෝටම එක වගේ ආදරෙයි. ලස්සන අයට වැඩියෙන් ආදරේ කරන්නේ නැ. ජේසුගේ කුරුස ගතවීම තුළින් පෙන්නුවේ හැමෝටම එකවගේ ආදරය කරන බවයි. අපිත් ජේසු වගේ ආදරයක් නැතිව සමාජයේ කොන්වී අසරණවී සිටින අය වෙත අනුකම්පා කරන්න ඕන. ඒ අය තුලින් ජේසුව දකින්න ඕන. අද ඔබට වඩා අසරණවුන දරුවෝ කී දෙනෙක් ඉන්නවාද?. දෙමාපියෝ නැතිව. ඉගන ගන්න පාසලක් මිල මුදල් නැතිව, ඉන්න තැනක් නැතිව ඔයාලාට මොනවාද අඩු , ඉතින් දරුවනි මෙනෙහි කරලා බලන්න මේ චතාරිකයේ මගේ මර්ධනක්‍රියා, පරිත්‍යාග වෙනුවෙන් ඔබ මොනවාද ඉතුරු කළේ කියා. ඒ ඉතිරිකරපු දෙවල් වලින් අසරණවු දරුවන් වෙනුවෙන් ඔබ මොනවාද කරන්න යන්නේ.

ඔබ සැමට සුබ පාස්කු මංගල්ලයක් වේවා !.

# සැබෑ සිත්හැරීමකින් සමිඳු උත්ථානයේ හවුල්කරුවෝ වෙමු !.

ගරු ඉන්ද්‍රා රත්නසිරි ප්‍රනාන්දු පියතුමන් විසිනි.

### හැඳින්වීම

ශු. සභාව විසින් දයාද කර ඇති තවත් ජනවන්දනා වසරක් තුළ ඇති වැදගත්ම වු කාල පරිච්ඡේදයක අගභාගයේ දැන් අපි සිටින්නෙමු. එනම්, චතාරික කාලය තුලදී කිතුනු අප හට ආරාධනා කරනුයේ අරුත්බර වු පාස්කු මංගල්‍යයක් සැමරීම සඳහාය. අප සැමගේ පාපයන් සඳහා ගැඹුරු මනස්ථාපනයකට අප කැඳවාගෙන මෙම වරප්‍රසාදීය කාලය තුලදී, අපගේ ජීවිතයන් තුලට **බලාපොරොත්තුවක්** හා **අරුත්බර බවක්** ගෙන එනු ලබන්නේ ජේසුස් වහන්සේ මරණය පරාජය කර ලැබූ විජයග්‍රාහී උත්ථානය තුළිනි. කිතුනු අපගේ වටිනාකම් වර්ධනය කරගැනීම උදෙසා ලැබෙන්නාවූ මෙම විශේෂිත කාලය අප ගත කරනු ලබන්නේ තවත් අප ගතකරනු ලබන සාමාන්‍ය දිනයන් ලෙසද නැතහොත් ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තියට සම්බන්ධ වෙමින් දිවි වෙනස් කරගැනීම උදෙසා උත්සහ දරන කාලයක් දැයි අපගේ සිත් විමසා බැලීමට මේ සුදුසුතම අවස්ථාව වේ.

ජේසුස් වහන්සේගේ උපත සිහිපත් කරනා නත්තල් කාලය තුලදී මෙන්ම උන්වහන්සේගේ මරණය හා උත්ථානය සිහිපත් කරනු ලබන චතාරික හා පාස්කු සමය තුලදීද ඒ සඳහා කිතුනු ජනතාව විශේෂාකාරයෙන් සුදානම් කරනු ලබයි. ආගමන කාලය තුලදීත් චතාරික කලය තුලදීත් අප සිහිපත් කරනු ලබන පොදු තේමාවක් ''මනස්ථාපනය'' යයි. ජේසුස් වහන්සේගේ පළමු ආගමනය හෙවත් නත්තල් මංගල්‍යයට පෙර පුරා සති 4 ක සුදනම් වීමේ කාලපරිච්ඡේදයෙන් සති 3 ක දීම සිහිපත් කරනු ලබන්නේ අපගේ පාපයන් පිළිබඳ මනස්ථාපනය වීමේ අවශ්‍යතාවයයි. එය ආගමන පහන් ටැඹ තුලින් අප සිත් සතන් තවදුරටත් කාවද්දනු ලබයි. චතාරික කාලය තුලද දින 40 ක සුදනම් වීමේ කාලය තුලදී මනස්ථාපනය සිහිපත් කරන අතර එය ආගමන කාලයේදී මෙන් නොව **ගැඹුරු ලෙස මනස්ථාපනය** හා ඒ තුලින් **සිත් හැරීමත්** පිළිබඳව සිහිපත් කරනු ලැබේ. ජෝවෙල් දිවස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් එතුමන් පෙන්වා දෙනුයේ ''වත ඉරාගෙන නොව සිත ඉරාගෙන පියාණන් වහන්සේ වෙතට පැමිණෙන ලෙසය.'' (ජෝවෙල් 2:13) තවද, ජේසුස් වහන්සේගේ ජීවිත කාලය තුලින් අන් අයට පෙන්නුම් කල අපගේ ජීවිත තුලින්ද පෙන්නුම් වියයුතු ගුණාංග ඉදිරිපත් කළහ. උන්වහන්සේගේ උපත ගවමඩුවක් තුළද, මරණය හෙවත් කුරුසියේ ඇණගැසීම කල්වාරි කඳු මුදුන මතදී සිදුවිය. මෙම අවස්ථා දෙකෙහිදී උන්වහන්සේ රැදී ඇත්තේ ජාතීන් තුල බලපෑමක් නොවන සෑම මිනිස් කොට්ඨාශයකටම ලංවිය හැකි ස්ථානයක් වීම විශේෂයකි.

ජේසුස් වහන්සේගේ උපත හා මරණය තුලින් පමණක් නොව, බෞතිස්ම ස්නාපනය ලැබීම, එතුමන්ගේ ධර්මය පතළ කල ස්ථානයන්ගෙන්ද එතුමාගේ මුළු ජීවිතය තුලින්ම අපට පෙන්නුම් කරනු ලැබුවේ උන්වහන්සේ ජනතාවට දැක් වු ආදරය හා විශේෂයෙන්ම එතුමන්ගේ ජීවිතයේ ඇති පොදු බවයි. අපද අප ගම තුල, සමාජය තුල ගත කරන ජීවිතයන් තුල මෙම පොදුබව අප තුලින් ඉස්මතු කර දක්වනවාද නැතහොත් අපත් අපගේ ජාතිය, කුලයට ගැලපෙන අයට පමණක් උදව් උපකාර කිරීම තුළින් එක් රාමුවකට කොටු වු ජීවිත ගතකරනවා දැයි සිතීමට හොඳම කාලය මෙය වේ.

මනුෂ්‍ය අපගේ දූර්වලතාවයන් නිසා බොහෝ අවස්ථා වලදී අප පාපයට ඉවහල් වේ. එනමුත් කිතුනු අපගේ එකම බලාපොරොත්තුව වන උත්ථානයේ ජීවිතයක් සඳහා මූලික අඩිතාලම වන අපගේ පව් පිලිගෙන සැබෑ ලෙස මනස්ථාපනය වීමයි. ආලේලූයියා සෙනසුරාදා දින පවත්වනු ලබන දිව්‍ය පූජාව තුළදි අප අමතනුයේ ''ආලෝකයේ දරුවන්'' ලෙසයි. මන්ද, ඒ වන විට අප සැබෑ සිත් හැරීමක් තුල ජීවිතයේ අඳුරු පැතිකඩින් මිදී උත්ථානය තුළින් ආලෝකයේ දරුවන් විය යුතු නිසාය. මෙම වසර තුලදී, ජේසුස් වහන්සේගේ ආලෝකයේ, ආදරයේ දරුවන් වීමයි. අවංක මනස්ථාපනයක්, සිත් හැරීමක් වෙතට අප යොමු වී ඇතිදැයි සිතා බැලිය යුතුයි.

අද සමාජයේ අපට හමුවන දුක, වේදනාව හා නොයෙකුත් ප්‍රශ්න තුළින් පීඩිත වු ජනතාව පිලිගැනීමට, ආදරය කිරීමට මා විශේෂයෙන් සමාව දීමට අප හදවත් අවදි විය යුතුයි. අන් අප පිළිගැනීම යනු ඔවුන් කරන ලද පව් අමතක කොට ඒ අප පිළිගැනීමයි. ජේසුස් වහන්සේ එතුමන්ගේ ජීවිත ක්‍රියා තුළින් ඒ බව ඔප්පු කල සේක. පව්කාර ස්ත්‍රීය හා සකේවුස් (ලූක් 19/1-10) පාපයේ ඇලී ගැලී සිටි චරිතයන් වු අතර ජේසු ඔවුන්ගේ පව්කාරකම ගැන නොසිතා අතිමහත් ආදරයකින් ඔවුන්ට සමාව දනය කොට පිලිගනු ලැබූහ. මිනිසුන්ගේ අඩුපාඩුකම්, දූර්වලකම් ප්‍රතික්ෂේප නොකොට ආදරයෙන් ඔවුන්ව පිලිගැනීමට අද අපවද කැඳවනු ලබයි. එලෙසම සමාව දීම පිළිබඳව ජේසු අපට සිහිපත් කරනුයේ අපගේ ජීවිතයන් තුල අපට වරද කරන්නන්ට අසීමිත ලෙස අප සමාව දිය යුතු බවයි. ජේසුස් වහන්සේ පැවසුවේ, සත් වාරයක් නොව සත්වාර සැත්තෑවක් (එනම් අසීමිත ලෙස ) අප සමාව දිය යුතු බව කමා නොවූ දාසයා පිළිබඳ උපමාව තුළින් පෙන්වා දෙනු ලැබේ. (මතෙව් 18:22) මෙම කරුණු 3 මගින් , එනම් පිළිග ැනීම , ආදරය හා සමාව දීම තුළින් ජේසු කිතුනු අප සැවොම උත්ථානයේ දරු දැරියන් බවට පත් කිරීමට උත්සහා දරන අතර, ඒ තුළින් ආලෝකයේ දරුවන් වීමටද මග පෙන්වනු ලබයි.

ජේසු සමිඳුන් තම ප්‍රසිද්ධ දේශනය කඳු මුදුනේදී (මතෙව් 5/1-12) පැවැත්වූ අතර දෙවන දේශනය පැවැත්වූයේ කල්වාරි කඳු මුදුනේදී කුරුසගසේ සිටයි. (ජුවාම් 19/28-30) එතුමන්ගේ ජීවිත කාලය පුරා ප්‍රසිද්ධ කල දේව වචනයේ සාරාංශයක් වශයෙන් එතුමන් කුරුසිය මත සිට පැවසූ ශ්‍රී වාක්‍ය 7 ඉදිරිපත් කිරීමට හැකිය එම වැකි කිහිපයක් තුළින් හෝ අපගේ දිවියට කෙතරම් දුරට සම්බන්ධ කරගත හැකි දැයි විමසා බලමු.

ඉතිරිය 14 වන පිටුවේ ........

## අපේ පව් නිසාවෙන් දිව්පිදු සමිඳුනි .....

කුරුසිය ගමනට අණ දුන් ඒ සඳ
ලෝකයක් ඔබට ගැරහුම් කෙරුවාද
දහසක් දන ඔබ හද රිදවුවද
ආදරයයි ගැළවුයේ ඒ දන

රිදුම් දෙනා කස පහර නිසා
ආදරයේ රුධිරය ගැළුවා
පාපය වෙළාන සිටි මිනිසා
ගළවන්නට ඔබ දිවි පිදුවා

පාපයේ බර ඔබ බිම හෙළනා විට
කුරිරු කෙළ පිඩක් මුවඟ රඳෙන විට
ලෝ දන වෙත ඇති ආදරයෙන් ඔබ
සවිය ලබා නැගුණා යළි තනිවම

කපාල කඳු මුදුනට වීලා
මුළු ලෝකය වෙත නෙත් යොමලා
සිටිනා දෙව්පුත තනි වීලා
ආදරයෙන් නෙත් නැහැවීලා

කෙතරම් ඔබ හද රිදවුවත්
අපේ පවින් කුරුසිය ලැබුනත්
සමාව ප්‍රේමය පිරුණු හදින්
සුව දුනි අද වූ නෙතට පවින්

**අදිතා කුමාරසිංහ**
10 ශ්‍රේණිය
ජාකොමේ ගොන්සල්වේස් දහම් පාසල - බෝලවත්ත


## මරණය පරදා උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ



**මියාරා රුදිගු**
4 ශ්‍රේණිය
ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය
කොළඹ 07

**මාසික සිතිවිලි ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ පළ කෙරේ .......**

## ප්‍රහේලිකා අංක 30



**( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )**

**හරහට**

1.''අනුන් විනිශ්චය නොකරන්න. එවිට ඔබත් ........................... කරනු නොලැබේ. යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාල සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

3. නාස්තිකාර පුත්‍රයාගේ උපමාවේ බාල පුතා පසුතැවිලි වී ගෙදර ගිය පසු කරුණාවන්ත පියා ඉතා සංතෝෂ වී ඔහුව පිළිගෙන .......................... කළ වස්සා මරා භෝජන සංග්‍රහයක් පිළියෙල කළේය. හිස්තැනට සුදුසු වචනය

4. ඊශ්‍රායෙල් ජනතාව ගනුදෙනු කරන්නන් රවටන හොර ................... පාවිච්චි කරන බව පවසමින් අමෝස් දිවැසිවරයා චෝදනා නැගුවේ ය. හිස්තැනට සුදුසු වචනය

7. දෙවියන් වහන්සේ මෙම දිවැසිවරයාට කැඳවුයේ ඔහු කුඩා කාලයේදීමය.

**පහළට**

1. ක්‍රිස්තුන් වහන්සේ කන්ද උඩ දේශනයේදී සැපත හා ........................... මෙය පිළිබඳව දේශනා කළ සේක.

2. ''මුලා නොවන්න නරක ආශ්‍රයෙන් හොඳ ............................ . නරක් වන්නේස'' යනුවෙන් ශු. පාවුළු තුමා පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ''මසුන් අල්ලන පිණිස .................... ගොස් දැල් හෙලන්නැ''යි ක්‍රිස්තුන් වහන්සේ සීමොන්ට වදාළ සේක මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ''වත ඉරාගෙන නොව සිත ඉරාගෙන නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න. ''යනුවෙන් මෙම දිවැසිවරයා තුළින් දෙවියන් වහන්සේ අපට ආරාධනා කරන සේක.

07. ආබ්‍රහම් තුමාගේ බිරිඳගේ නම ................

(මෙම ප්‍රහේලිකාව පිරවීමේදී පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ලූක් 5/4, 6/37, 6/20, 15/30 , ආමෝස් 7/4-6 , 1 සාමුවෙල් 3, උත්පත්ති 18, 1 කොරින්ති 15/ 33, ජෝවෙල් 2/13)

# ලෝ වටා ක්‍රිස්තු දුක්ප්‍රාප්තිය

**" ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය කේන්ද්‍ර කරගෙන නාට**
**බප්‍රාප්තිය, වදගාවිනා, කුරුසියේ ඇණගැසීම නාට්‍යානු**
**චතාරික සමයේ විවිධ ජනවන්දනා පිළිවෙත් ස**
**ලොව විවිධ රටවලි**

**යුරෝපයේ** ඉපැරණිම පාස්කු නාට්‍යය ස්ලොවේනියාවේ ස්කොෆ්ජා ලොකා ලෙස වාර්ථා වේ. අවසන් වරට එය 2009 දී කරලියට ආවේය. ජර්මනියේ බැවේරියාව කේන්ද්‍රකරගත් ඔබර්අමර්ගේ පාස්කු නාට්‍යය 1634 ඇරඹූ අතර සෑම දසවසරකට වරක් පැවැත්වෙන ලෝකයේ වඩාත් ප්‍රසිද්ධ පාස්කු නාට්‍යයයි. එහෙත් දහතුන්වන සියවසේදී ලතින් බසින් බෙනඩික්ට්බන් පාස්කු නාට්‍යය ප්‍රසිද්ධ ආගමික නාට්‍යයකි.



ජර්මනියේ ෆ්‍රැන්ක්හර්ට් පාස්කු නාට්‍යය බල්ඩිමර් වොන් පීටර්වේල් දින දෙකක් පුරා රඟදැක්වූයේ 1350 - 1381 දක්වාය. 1400 සිට 1515 දක්වා සමයේ දී ලෝකයේ පාස්කු නාට්‍ය නව ප්‍රගතියක් පෙන්නුම් කළ අතර 1467 දී ෆ්‍රැන්ක්හර්ට් පාස්කු දැක්මක් 1514 දී ෆ්‍රෙඩ්බර්ග ර් හා අල්ස්හෙල්ඩර් නාට්‍යයන් බිහිවිය. 1583 දී ශුද්ධාත්මයාණන් වහන්සේගේ සම්ප්‍රාප්තිය එක්විය.

14 සියවසේදී පාස්කු නාට්‍ය වලට තහංචි පැනවූ අතර 1549 දී ස්ට්‍රාස්බර්ග් කතිකාව හා 1548 දී ප්‍රශ පාර්ලිමේන්තුවේ මේ ගැන වාද විවාද ඇතිවී දේව අනාවරණ හා අභිරහස් අපයෝජනය කිරීමට විරෝධතා මතුවිය.

ඔස්ට්‍රේලියාවේ 1958 දී ලෝනා පාස්කු දැක්ම ක්විනස් ලන්තයෙන් එළි දුටුවේය. නිව්සවුත් වේල්ස්හි ටුරාමුරා බ්‍රිස්බේන් රිවර්ස්ටේජ් ආදි පාස්කු නාට්‍ය එරට වේදිකාගතවේ.

බ්‍රසීලයේ වාර්ෂික පාස්කු දැක්ම සඳහා ඊසාන දිග බ්‍රසීලයේ පර්නාම්බුකෝ හි වර්ග මීටර් 100,000 ශාලා , නගරයක් ඉදිවේ. මෙය ලෝකයේ විශාලතම විවෘත වේදිකා රඟහලයි. 500 කට අධික නළු නිළි පිරිසක් වේදිකා නමයක රඟපාන්නේ ගල් බිත්ති යොදා තැනූ ජෙරුසලම් නගර රඟහලද උපයෝගි කර ගනිමිනි.



කැනඩාවේ බැඩ්ලැන්ඩ්ස් පාස්කු දැක්ම වාර්ෂිකව

# ය ජීව ගන්වන පාස්කු නාට්‍ය

**ට්‍ය ඉදිරිපත් කිරීම ඈත අතීතයේ සිට පැවත එන්නකි. දුඃ
සාරයෙන් ඉදිරිපත් කිරීම පර්සියාවෙන් ආරම්භ වී ඇත.
මඟ කල්වාරි ගමන පසුබිම් කරගත් නාට්‍යයන්ද
ලින් එළි දුටුවේ ය.”**

ඇල්බර්ටාහි ඩ්‍රම්හෙලර් හි රංග ගතවේ. එහි තුන්සියයකට අධික නළු නිළියන් හා සංගීතඥ පිරිසක් සිටිති.



ටොරොන්ටෝ හි ක්වින්ස්වේ ආසන දෙව්මැඳුරේ 3200 කට ආසන පනවා ඇති පාස්කු මංඩපයේ වාර්ෂිකව පාස්කු නාට්‍යය රඟදැක්වේ. ඊට ජීවමාන නළු නිළියන් පමණක් නොව සතුන්ද , ගායකයන් හා නැටුම් ශිල්ලින්ද යොදා ගනී.



මෝල්ටා හි පාස්කු නාට්‍ය රැසක් චතාරික සමයේ රඟ දැක්වේ. සෑම නගරයක , ගමක පාස්කු නාට්‍ය රඟදැක්වෙන අතර පාස්කු නාට්‍ය තරඟාවලින් ද අඩුවක් නැත.


පිලිපීනයේ පාස්කු නාට්‍ය හැඳින්වෙන්නේ සෙනාකුලෝ මැයෙනි. සේනාකුළු ශාලාව සිහිගන්වන මේ පාස්කු නාට්‍ය බොහොමයක් ශුද්ධවූ සතියේ වේදිකා ගතවේ. එරට ක්‍රිස්තු දුක්ප්‍රාප්තිය සිහි ගන්වමින් මහ සිකුරාදා පණ පිටින් කුරුසියේ ඇණ ගැසෙන මිනිසුන් පැම්පන්ගාවේදී දැකගත හැකිය. මෙය ලොව පුරා මහත් ප්‍රසිද්ධියක් උසුලන ජීවමාන දුඃඛප්‍රාප්තියකි. පෝලන්තයේ ද පාස්කු නාට්‍ය ඉතා ජනප්‍රිය අංගයකි. ලෝකයේ පැරණිතම පාස්කු දැක්මද එරට පවතී ස්පාඤ්ඤයේ කැටලෝනියා ප්‍රදේශයේ චතාරික සමයේ පාස්කු නාට්‍ය 1538 සිට සුලබව දක්නට ලැබෙන අතර 1996 දී එහි වේදිකාගත වූ පාස්කු නාට්‍ය-යක පුද්ගලයන් 726 දෙනෙක් රඟපා ලෝක වාර්තාවක්ද තබා ඇත.

නෙදර්ලන්තයේ සෑම පස්වසරකට වරක් වේදිකා ගත වන ඩි පැස්සිස්ප්ලෙන් 1931 දී ආරම්භ විය. ලෝක යේ ඉතා ප්‍රකට පාස්කු නාට්‍යයකි. ඇමරිකා එක්සත් ජනපදයේ විවිධ ප්‍රාන්තවල චතාරික සමයේ පාස්කු නාට්‍ය රඟ දැක්වේ. එංගලන්තයේ ද චතාරික සමයේ පාස්කු නාට්‍යවල අඩුවක් නැත.

**- ශිරාන් මෛත්‍රි -**



# සිරි සළුව



සිරි සළුව ලෙස අද අප ව්‍යවහාර කරන රෙදිකඩ ක්‍රිස්තුන් වහන්සේ උකුත්වීමෙන් පසුව උන්වහන්සේගේ ප්‍රාණය නිරුද්ධ සිරුර ගල් ලෙනෙහි තැන්පත් කිරීම සඳහා භාවිත කළ රෙදි කඩ නොහොත් උන්වහන්සේගේ භූමදාන සළුව යි.

✍ ගරු කණිෂ්ක පෙරේරා - සා.බෙ.නි. සොයුරු විසිනි.

ශුද්ධවූ බයිබලයේ සඳහන් වන උන්වහන්සේගේ දුක් ප්‍රාප්තිය පියවි ඇසින් දැකගත හැකි වඩා වැදගත්ම හා ප්‍රබලම සාක්ෂිය ලෙස ශ්‍රී සළුව හඳුන්වා දීමට හැකිය. ඒ මෙම සිරි සළුව තුළින් විද්‍යාවේද සහය ඇතිව හඳුනාගනු ලැබූ බොහෝ දෑ ශු. බයිබලයේ එන ක්‍රිස්තු දුක් ප්‍රාප්තිය හා මනාව සැසඳෙන හෙයිනි.

සිරි සළුව මත පදනම් වන විට ක්‍රිස්තු දුක් ප්‍රාප්තිය ප්‍රධාන ක්ෂේත්‍ර පහක් ආවරණය වන පරිදි විග්‍රහ කළ හැක. ඉන් පළමුවැන්න ලෙස උන්වහන්සේගේ කටු ඔටුන්න ගැන සළකා බලමු . ශු. ජුවාම් 18/ 36-37 දැක්වෙන පරිදි ක්‍රිස්තුන් වහන්සේ රාජකීයත්වය පිළිබඳ පටු කෝණයකින් දුටු සොල්දාදුවන් උන්වහන්සේගේ හිස මතට කටු රොදක් තබා වැරෙන් පහර එල්ල කළ සේක. (ශු. මතෙව් 27/29-30) මෙහි විශේෂත්වය වන්නේ මෙම ඔටුන්න අප සාමාන්‍යයෙන් දකින හිස වටා රවුමක් ලෙස එතුවක් නොව මුළු සිරසම වැසෙන සේ දැමූ හිස්වැස්මක් නොහොත් තොප්පියක් ලෙස වීමයි. තවද මෙම ඔටුන්න හේතුවෙන් හිස ප්‍රදේශයේ තුවාල 20 පමණ හා නළල් ප්‍රදේශයේ තුවාල 13 ලෙස මුළු තුවාල 33 ක සටහන් සළුව මත තැන්පත්ව ඇත. නළල් ප්‍රදේශයේ ඇති ප්‍රතිවිරුද්ධ අතට ඇඳි තුනේ ඉලක්කම (Ɛ) ද එවන් වූ කටුවක් හිස ප්‍රදේශයට යන නහරයක් හරහා යාමෙන් ගලා ආවකි. එසේම සළුවේ පිටුපස සටහන්වන තැනින් තැන විසිරුණ රුධිර පැල්ලම් අපට ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී මරණයට දින කිහිපයකට පෙර බෙතානියේ සිදුවූ සිදුවීම ( ශු. මතෙව් 26 /12) සනාථ කරයි. එදින ක්‍රිස්තුස් වහන්සේගේ හිස ගැල්වූ විලවුන් විශේෂය හරහා රුධිරය ගමන් නොකිරීම නිසා එසේ හිඩැස් ඇතිවූ බව විද්‍යාව අපට පහද දෙයි. මන්ද රුධිරය යනු වැඩි ප්‍රතිශතයක් ජලය අඩංගු ද්‍රාවනයකි. එබැවින් අදල විලවුන් විශේෂය (ග්‍රීස් වැනි ) හරහා රුධිර ගමනයක් සිදු නොවේ එම නිසා මෙම හිඩැස් ඇතිවී ඇත.

දෙවනුව උන්වහන්සේගේ ශ්‍රී මුහුණ වෙත අවධානය යොමුකරන විට එය ඉදිමී, විරූපී වී, ඇහි බැම ගැළවී හා නාසය කැඩී තිබෙනු පැහැදිලිව නිරීක්ෂණය කළ හැක. මේ සඳහා ප්‍රධාන හේතු දෙකක් පාදක වූ බවට හඳුනා ගත හැක. ඉන් පළමුවැන්න වන්නේ උන්වහන්සේව පාවා දීමෙන් පසු උන්වහන්සේට එල්ල කළ අතුල්පහර ශු. ලූක් 22/ 63-65 හා දෙවනුව උන්වහන්සේ කුරුසිය රැගෙන යාමේදී සිදුවූ වැටීම්ද වේ. මෙහි ඇති විශේෂත්වය වන්නේ එද උන්වහන්සේ සාද නිමකළ කුරුසියක් ගෙන නොගිය බවත් කිලෝග්‍රෑම් 40 - 50 බරැති තිරස් දණ්ඩක් පමණක් ගෙන ගිය බවටත් එම දණ්ඩේ දෙපසට දෑත් බැඳ තිබූ බවත්, දකුණ උරහිසේ තුවාලය ඇතුළු අනික් තුවාල සාක්ෂි දරයි. තවද සිරස් කුරුස දණ්ඩ කොටස කපාල පිටියේ ස්ථාවරව තිබූ බව ඉතිහාසය සාක්ෂි දරයි.

තෙවනුව උන්වහන්සේගේ ඇළයේ තුවාලය සළකා බලමු. ශු. ජුවාම් 19/31-39 සඳහන් පරිදි ක්‍රිස්තුන් වහන්සේගේ ඇළයේ පස්වන හා සියවන ඉළ ඇට අතරින් සොල්දාදුවකු විසින් එල්ල කළ උල් ආයුධයක් ගමන් කිරීම නිසා මෙම තුවාලය ඇතිවී ඇත. තවද එහිදී රුධිරය හා ජලය ගලා ආ බවට සිරි සළුව සාක්ෂි දරයි. 4.8 Cm දිගකින් හා 1.5 Cm පළලකින් යුත් මෙම තුවාලය උන්වහන්සේගේ මරණයෙන් පසු සිදුවූවක් ලෙස හඳුනා ගත හැක. තවද කුරුසියෙන් බාන ලදුව මරි මවු ඇකයේ තුවාලය තුළින් දෙවන වර රුධිරය ගළා ගිය බවත් එය සිරුරේ පිට පැත්තේ වකුකඩු ප්‍රදේශය දිගේ ගළා ගළා ගිය බවටත් සිරි සළුව කරුණු දක්වයි.

සිව්වනුව උන්වහන්සේගේ ඇණගැසීම පිළිබඳ විමසා බැලීමේදී ප්‍රධාන කොට දෙඅත් වෙන වෙන මත් දෙපා එකටත් ලෙස ඇණ අත්ල සිදුරුවන ලෙස නොව මැණික් කටුව ප්‍රදේශයේ හිඩැස හරහා ඇණ ගසා ඇති වීමයි. එහිදී මහාපොට ඇඟිල්ලට රුධිරය සපයන නාලය අක්‍රීය වන ලෙස ඇණය ගමන් කිරීම නිසා මහපොට ඇඟිල්ල අප්‍රාණිකව අත්ල දෙසට නැවෙන අතර සළුව මත ඇඟිලි 4 බැගින් නිරූපනය වන්නේ එබැවිනි. අවසාන කොට කසපහර ගැන සාකච්ඡා කිරීමේදී එම සප පහර නම් විශේෂ කස වර්ගයක් භාවිත කර සිදු කර ඇති බව පැහැදිළි වේ. රෝමානු කසවල විශේෂත්වය වන්නේ කසයේ අගට ඊයම් බෝල හෝ සතුන්ගේ ඇටකටු සවි කර තිබීමයි. එහිදී එල්ල කරන පහරක් පහරක් පාසා අදල කොටස් සම මත පැටලී හමත් සමඟ පිටතට පැමිණේ. මේ නිසා උන්වහන්සේගේ උරබාහුවල සිට දෙපතුල දක්වා විහිදුනු සෙ. මීටර් 1.5 - 3.00 වූ තුවාල විශාල ප්‍රමාණයක් දැකගත හැකි අතර එමගින් කස පහර ගැසීමේදී උන්වහන්සේ නිරුවත්ව සිටි බවට පැහැදිළි වේ. තවද කස පහර නිසා ඇතිවූ තුවාල V හැඩය ගන්නා අතර උස සහ මිටි මිනිසෙක් බැගින් දෙපස සිට වැරෙන් එල්ලකරන ලද පහරවල් නිසා එසේ සටහන් වී ඇත.

## බදුල්ල පදවිය

චතාරික සමය නිමිත්තෙන් භාවනාත්මක පාද නමස්කාරයක් පසුගියදා බණ්ඩාරවෙල සා. අන්තෝනි දහම් පාසලේ පැවැත්වුණි.

කිතු දහම් මධ්‍යස්ථානයෙන් ආරම්භ කළ මෙම පාදනමස්කාරය දේවස්ථානය දක්වා ගමන්කලහ. මෙහි දී දහම් දරුවෝ එම ස්ථානවල අදාළ චරිත නිරූපනය කරමින් රඟ දැක්වූහ. මෙය මෙහෙය වනු ලැබුයේ හපුතලේ ''භාවර්ධන්'' දෙව්සත්හලේ ගරු යොහාන් ප්‍රනාන්දු පියතුමන් විසිනි.

බී. මනෝජ් දිවංක
11 ශ්‍රේණිය
සා. අන්තෝනි දහම් පාසල - බණ්ඩාරවෙල

# චතාරික ළමා ක්‍රියාකාරකම්

## කොළඹ අගරදගුරු පදවිය



අවිස්සාවේල්ල ප්‍රදේශයේ ප්‍රධාන පාසල් තුනක්වන අවිස්සාවේල්ල සාන්ත මරියා විද්‍යාලය , සීතාවක මධ්‍යමහා විද්‍යාලය හා ජනාධිපති විද්‍යාලයේ කතෝලික දූ දරුවන් හා ගුරු මහත්ම මහත්මීන් එක්ව අවිස්සාවේල්ල සා.මරියා දේවස්ථානයේදී චතාරික වැඩසටහනක් පැවැත්වුණි.

අවිස්සාවේල්ල මීසම් සේවක ගරු මැක්සිමස් රුද්‍රිගුපුල්ලේ මීසම් සහයක ගරු ටෙරන්ස් ප්‍රසංග යන පියතුමන්ලාගේ මුලිකත්වයෙන් මෙය පැවැත්වුණි. මෙහිදි චතාරික කාලය පිළිබඳ ළමුන් දැනුවත් කළ අතර එළිමහන් පාදනමස්කාරයක් හා දිව්‍ය පුජාවක් පවත්වන ලදී

(මහේෂා ගයන්ත්‍රී)

## කුරුණෑගල පදවිය



උඩුබද්දව අධ්‍යාපන කොට්ඨාශයේ පාසල් වල කතෝලික දරුවන්ගේ සහභාගීත්වයෙන් ළමා පාදනමස්කාරයක් දුනකදෙනිය රෝමානු කතෝලික විදුහල විසින් දුනකදෙනිය සා. අන්තෝනි දෙව්මැදුරේදී සංවිධානය කළහ.

මෙදින භාවනා වැඩසටහනක් , එළිමහන් පාද නමස්කාරයක් හා දිව්‍ය පුජාවක්ද පැවැත්වුණි. මෙයට එක්වූ ළමුන් සඳහා පියතුමන්ලා විසින් පාපොච්චාරණය ඇසීමද සිදු කළ අතර මේ සඳහා ළමෝ 500 ක් පමණ සහභාගී වුහ.

(මිල්රෝයි ප්‍රනාන්දු)

---

උතුරු කොළඹ දිසාවේ ළමා ධර්මදූත සාමාජික සමාජිකාවෝ ජේසුගේ කල්වාරි ගමන සිහිපත් කරමින් පසුගිය ද මට්ටක්කුලිය ශා. මරියා දෙව් මැදුරේදී පාදනමස්කාරයකට සහභාගී වුහ. දිසා අධ්‍යක්ෂ ගරු ජුඩ් ලක්ෂාන්ත පියතුමන් විසින් මෙය සංවිධානය කර තිබුණි.

(ට්‍රිසිල් ඇෆ් මැන්දිස් )



# ලොව ගැලවූ මිදුම්කරුවාණෝ



**රෂාන් සුවිශ්ක**
02 ශ්‍රේණිය
ශා. ජුඩ් විදුහල - කුරණ



**දිමුතු සෙනාල්**
02 ශ්‍රේණිය
පාතිමා මාතා දහම් පාසල
යායමුල්ල - වැල්පිටගම මීසම

**පුංචි අපේ චිත්‍ර පිටුව**

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.


"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

**හිමංසලා මල්ෂානි**
02 ශ්‍රේණිය
සිරිහඳ දහම් පාසල
බොල්ලත



**ක්‍රිෂ්නි ඇන්තනිස්**

04 ශ්‍රේණිය
ශා. බ්‍රිජට් කන්‍යාරාමය
කොළඹ 07.



**තරුෂිකා දෙව්මිණි**

02 ශ්‍රේණිය
සුරදූතික බාලිකා විදුහල
කුලියාපිටිය



**කවිශ්ක දිල්හාර**
8 ශ්‍රේණිය
සාන්ත සේවියර් දහම් පාසල
තල්ගහපිටිය



**නිර්මාල් රොෂන්ත පෙරේරා**
03 ශ්‍රේණිය
සාන්ත සෙබස්තියන් විදුහල
මොරටුව



**සුපුන් මාරියෝ ලෝචි**
4 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල
තොඩුවාව



# පාපි බව හැර දා ඔබ වෙත ආවෙමි



ජීවන කතරේ අතරමං වී
දස අත දුවමින්
වෙහෙස නිවා ගැනීමට
සමිඳුනි ආවෙමි සරණ සොයා
සැමගේ දුක් කඳ ඔබ දන්නා බව
කීවත් සමිඳුනි ඇයි ද ? මෙසේ
මා දෙස නොබලා ඉවත බලාගෙන
අනේ සමිඳුනි , හති වැටිලා හරි
ඔබ වෙත ආවෙමි.
දෙපා අසලම රැඳී සිටිමින්
සමාව අයදිමි දෝත් නගා
දෑසින් වැගිරෙන කඳුළු බිඳුවක්
පිසදූ ගන්නට නොමැත සවියක්
ඔබ වෙත ආවෙමි සුවය සොයා
ආපසු හැරිලා දුවලා යන්නෙමි
ඔබ මා හට අඬ ගසන තුරා
වරදට සමාව දෙන්නකො සමිඳුනි
වරදක් නොකරමි මින් මතුදු
ඔබ ගත් කුරුසිය මා කරපිට ගෙන
දිවි ඇති තුරු ඔබ පසුපස එන්නෙමි
දෙන්නකො මට සවියක්, දෙන්නකො මට දිරියක්
දෙන්නකො මට සුවයක්
සමිඳුනි වෙන්නකෝ මට සරණක්


**එන්. එච්. මහේෂ් සමින්ද**
13 ශ්‍රේණිය (කලා අංශය)
පාතිමා මාතා දෙව්මැදුර
යායමුල්ල - (වල්පිටගම මීසම)

# ජේසුස් වහන්සේ මරණයට තීන්දුව ලැබීම



**දිල්ශාන් සම්පත් ප්‍රනාන්දු**
12 ශ්‍රේණිය
සිරිකුරුස දහම් පාසල - මීගමුව

# කුරුසියේ දිවි පිදූ ජේසුනි




කුරුස ගසේ දී එදා
දිව්‍ය වූ ශ්‍රී රුධිරය ගලා
ජේසුගේ ශ්‍රී මුවමඩලේ
අපට දනවන ආදරය දිස්වූනා

කල්වාරි යාගයේදී
කුරුස ගසේ දිවිපුදා
ලොවේ පාප මකාලන්න
අප වෙනුවෙන් වැයවූනා

ලෝ දනාට සමාව දී
සිය වදනින් ලොව සනසා
මරිමව්ගේ පුතා
දෙව්දූ තුරුලෙ සැතපූනා

**හෂිනි මලීෂා**
10 ශ්‍රේණිය
ජාකොමේ ගොන්සල්වේස් දහම් පාසල
බෝලවත්ත

# පාස්කුව

මරණය පරදා සදාතනික ජීවිතය පෙන්වා දුන්
අපගේ ජේසුනි, අප පාපයෙන් මුදා ගන්න
ඔබ අප වෙනුවෙන් බොහො දේ කර ඇත
එහෙත් ආදර ජේසුනි, මෙතුවක්කල් මා ඔබ වෙනුවෙන්
කර ඇත්තේ කුමක්ද?
උත්ථාන වූ සමිඳුනි , ඔබගේ දුක්ප්‍රාප්තිය
මරණය , උකුත්වීම සිහිකරන මේ සමයේ
සැබෑ සිත් හැරීමකින් අපගේ දිවිය වෙනස් කරමින්
එතෙර වන්නට මෙවර පාස්කුවේදී සිතට ගනිමු !

**ෂෙනෝන් කාවින්ද පෙරේරා**
9 ශ්‍රේණිය
ශා. රෝගුස් මුනි දහම් පාසල - දෑලතුර

6 වන පිටුවේ ඉතිරිය ........

● ''පියාණනී මොවුන් නොදැන කර නිසා මොවුන්ට සමා වුව මැනව'' (ලූක් 23/34)

ජේසුස් වහන්සේ මොලොව ආගමනයේ මූලික හේතුව වූයේ ලෝවැසි ජනතාව පාපයේ බැමි තුලින් මුදවා ගැනීමයි. ඒ වෙනුවෙන් තම ජීවිත කාලය කැප කල උන්වහන්සේ එතුමාගේ මරණ මොහොතේදීත් කුරුසගසේ සිට තම පෙම්බර පියාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ පාපී අපගේ වරදවල් උදෙසා සමාව ලබා දෙන ලෙසයි. මේ තුළින් එතුමන් පාපී අප වෙනුවෙන් ඇති උතුරායන ආදරය විදහා පානු ලැබේ. අද අප ජීවත් වන සමාජය තුල මෙවැනි වූ සමාව දානය කිරීම උදෙසා අප සූදනම් ද? නැතහොත් සමාව දීම වෙනුවෙන් ඊට විරුද්ධ ක්‍රියාවක් කිරීම තුළින් තෘප්තියක් ලබන තැනැත්තේ වේද? සමාව දීමේ ඇති වැදගත් බව අප ඉහතදී සඳහන් කර අතරම අප තුළින් සමාජය දැකිය යුත්තේ, අපගේ ජීවිතයන් තුල ඇති අඳුරු පැතිකඩ නොව අප වර්ධනය කර ගත් අප සතු උතුම් ගුණාංග පමණක්ම වේ.

●''අද ඔබ සමඟ පාරාදීසයේ සිටින්නේය.'' (ලූක් 23/43)

සොරුන් දෙදෙනකු මැද ඇණ ගැසුනු ලැබූ ජේසුස් වහන්සේ හට, ඔවුන්ගේ ගැලවීම පිළිබඳව අභියෝගයක් වම්පස උන් සොරාගෙන් එල්ල වූ අතර දකුණු පස වූන් සොරා ඔහුගේ පාපී බව පිළිගැනීම අරඹයා ඔහුට ස්වර්ගීය සම්පත් භුක්ති විඳීමේ භාග්‍ය උදා වුනි. අද සමාජයේ ජීවත් වන අප , අපගේ පාපී බව පිළිගැනීමට අපගේ ඇති ලැජ්ජාව හේතුවෙන් ඒ පාපයන් තුලම ඇලී ගැලී සිටිමින් අධ්‍යාත්මිකව නම් ජේසු සමිඳුන් අපහට එක් පොරොන්දුවක් ලබා දුන් සේක. එය නම් ස්වර්ග රාජ්‍යයයි. කිතුනු ජනතාවක් වශයෙන් අපගේ එකම බලාපොරොත්තුව වන්නේද ස්වර්ග රාජ්‍ය ලබා ගැනීමයි. එම නිසා අපගේ පාපී බව පිළිගෙන සැබෑ සිත් හැරීමකින් යුතුව ස්වර්ග රාජ්‍ය වෙත ලංවීමට අපත් උත්සහ දරමු.

● ''මම පිපාස වෙමි.'' (ජුවාම් 19/28)

පියාණන් වහන්සේගේ පුත්‍රයා වුවද, දෙවිකෙනෙකු වුවද මනුෂ්‍යයකුගේ අවස්ථාවකට පැමිණි තවත් එක් අවස්ථාවකි. ශාරීරික වශයෙන් මෙන්ම ආත්මීක වශයෙන්ද ජේසු සමිඳුන් හට මෙම අවස්ථාවේදී පිපාසය දැනෙන්නට විය. කුරුසිය දරා කල්වාරි කඳු මුදුන වෙතට පැමිණි ගමනත්, කඳු මුදුනේදී විඳි වේදනාවත් ශාරීරික පිපාසට හේතු වූ අතර ආත්මීක පිපාසය වූවේ පියාණන් වහන්සේගේ දේව කැමැත්ත ඉටු කිරීමයි. අපගේ ජීවිත දෙස හැරිබැලුවහොත් අප දේව කැමැත්ත ඉටු කිරීමට කිනම් ආකාරයක උත්සහයක්, පිපාසයක් තිබෙනවාද, දේව කැමැත්ත පිළිගැනීමටත්, එය ඉටු කිරීමටත් උත්සහ දැරීම තුළින් පිපාසය වෙනුවෙන් ලැබූ පැන්පොදක් සේ ඒ තුළ ජීවිතයේ තෘප්තිය ලබා ගැනීමට උත්සහ දරමු.

● ''පියාණෙනි ඔබගේ ශ්‍රී හස්තයට මාගේ ප්‍රාණය භාර කරමි.'' (ලූක් 23/46)

ගවහලේ උපතේන් ද , ජෝර්දාන් නදියේ ස්නාපනයෙන්ද තම දූත මෙහෙවර ආරම්භ කොට පාපී අප වෙනුවෙන් කුරුසිය මතදී තම අවසන් හුස්ම පියාණන් වහන්සේ වෙතට ඔප්පු කළ මොහොතයි මේ. පියාණන් වහන්සේගේ කැමැත්ත ජේසු සමිඳුන් අතින් පියාණන් හට රිසි පරිදි ඉටු විය. අප, අප ගැනම සිතා බැලුවහොත්, අප රටට, ගමට, රැකියාව කරන ස්ථානය තුළ, නිවස තුළ , අපගේ කාර්යයන්, අප අතින් සිදු විය යුතු සේවාව දේව කැමැත්ත පරිදි ඉටුවී තිබෙනවාද? අපගේ මරණ මොහොතේදී මෙවැනි වදන් පෙළක් තුලින් පියාණන් වහන්සේව අමතන්නට අපට භාග්‍ය ලැබේදැයි මෙම උතුම් කාලය තුලදීවත් අප සිතා බලමු.

ජේසු සමිඳුන් කුරුසියේ සිට පැවසූ මෙම වදන් කිහිපය තුලින් අපගේ ජීවිත දෙස හැරී බලන්නටත් අඩුපාඩු හරිගස්වා ගැනීමටත් උත්සහ දැරිය යුතු අතරම මේ වදන් මහ සිකුරාද දිනයට පමණක් සිදු නොකොට සිත් තුළ සෑම වේලෙහිම රඳවා ගැනීමට උත්සහ දරමු. නව ගිවිසුම තුල අපට හමුවන සුවිශේෂ කතුවරයන් 4 දෙනාගේම එම සුවිශේෂ ලිවීමේදී පාදක කරගනු ලැබූ ප්‍රධාන සාධක වනුයේ ජේසු සමිඳුන්ගේ විජයග්‍රාහී උත්ථානයයි. මරණය පරාජය කරමින් ලැබූ උත්ථානය තුලින් සුවිශේෂිත වූ අත්දැකීමක් විඳි ඔවුන් එම සිද්ධිය හේතු පාඨක කර ගනිමින් ජේසු සමිඳුන්ගේ ජීවිතය පිළිබඳ අවබෝධයෙන් යුක්තව තව සුවිශේෂයන් ගොඩ නැගූහ. තවද නත්තල් මංගල්‍යය සඳහා අප බොහෝදෙනාගේ වැඩි අවධානයක් යොමුවන නමුත් ජන වන්දනා වසරේ දී කිතුනු අපගේ වැදගත්ම මංගල්‍යය වනුයේ පාස්කු මංගල්‍යයයි. මන්ද, ඒ තුලින් අපට ගැලවීමක්, නව ජීවනයක් සඳහා බලාපොරොත්තු ලබා දෙන බැවිනි.

## නිගමනය

දින 40 ක කාලයක් අවසන් වන විටදී අපගේ අධ්‍යාත්මය විමසා බැලුවහොත් ජේසු සමිඳුන්ගේ ජීවිතය තුළ පෙන්නුම් කල ඒ උතුම් ගුණාංග එනම් , පිළිගැනීම, ආදරය හා සමාවදීම වෙතට අපගේ මනසින් හා ක්‍රියාවෙන් සුළු වශයෙන් හෝ ඇතුල්වී ඇතිදැයි සිතා බැලීමට නම් සුදුසුතම කාලය වේ. අප අසල්වැසියාට සමාජයේ ප්‍රශ්න ගැටළු හමුවේ දුක්විඳිනා අය වෙනුවෙන් අප මෙම ගුණාංග යෙදවූයේ නම් චතාරික කාලයේ වෙනස්වීම පිළිබඳව තම හෘද සාක්ෂිය ගැන සිතන තමන්හටම සතුටට පත් විය හැකියි. එනම්, ජේසු සමිඳුන්ගේ උත්ථානය තුලින් එතුමන්ට සාක්ෂි දරන්නන් වෙමු. නමුත් තවමත් අප අන් අය වෙනුවෙන් නොසිටින්නේ නම්, අන් අයගේ දුක, වේදනාව තේරුම් නොගන්නේ නම් , අප පවුල් තුළ එකිනෙකාට සමාව නොදෙන්නේ නම් , ජේසු සමිඳුන් තවමත් අප වෙනුවෙන් බලා සිටින සේක. සැබෑ මනස්ථාපනයක්, සිත් හැරීමක් තුලින් එතුමන් වෙතට එනතෙක් මග බලා සිටින සේක. මෙම වරප්‍රසාදීය කාලය අප ජීවිතයන් වෙතට පෞද්ගලික ධර්ම විවේකීය කාලයක් හා සමාන වන අතර ඒ තුලින් උත්ථානය සඳහා සාක්ෂි දැරීමටත්, උත්ථානයේ දරු දැරියන් වහන්නටද උත්සුක වෙමු.


උත්ථානයේ අසිරිය
ඉදිරිපත් කිරීම- ආමල් ද සිල්වා-
.... සියලු වද වේදනා විඳ මරණයට පත් ජේසුස් වහන්සේගේ මෘත ශරීරය අරිමතියේ ජෝසෙප් අළුත් සොහොන් ගැබෙහි තැන්පත් කර, දොරකඩට විශාල ගලක් තැබුවා.
ඉන්පසු එළඹුණු සතියේ පළමු දින හිමිදිරියේ මග්දලාහි මරියා සහ ජාකොබ්ගේ මව මරියා මෘත ශරීරයේ ආලේප කිරීම සඳහා සුවඳ දුවද රැගෙන සොහොන් ගැබ වෙත පියමැන්නා.
සියලු සුවඳ දුවස සූදානම් නේද මරියා..?
ඔව් මා සියල්ල රැගෙන ආවා!
සොහොන් ගැබ වෙත පැමිණි ඔවුන් දුටුවේ වසා තිබූ විශාල ගල සොහොන් ගෙයින් ඉවතට පෙරලා තිබූ බවයි.
මොකවා...? වසා තිබූ සොහොන් ගෙය කවුරුන් හෝ විවෘත කරලා....අර බලන්න.... එයින් විශාල එළියක් විහිදෙනවා.
ඔවුන් දෙදෙනා සොහොන් ගැබට ඇතුළු වුවත් එහි ජේසුස් වහන්සේගේ ශරීරය තිබුණේ නැහැ. ඒ ගැන ඔවුන් වියවුල්ව සිටියදී ඒ අසල කාන්තිය විහිදුවන වස්ත්‍ර ඇඳගත් අයෙක් සිටිනු දුටුවා.
බිය නොවන්න_ ඔබ ජේසුස් වහන්සේ සොයනා බව දනිමි. උන් වහන්සේ මෙහි නැත. උන්වහන්සේ වදාළ ලෙසම උත්ථාන වූ සේක.
ස්ත්‍රීන් ගලීලයට ගොස් සිදුවූ සියල්ල ශ්‍රාවකයින්ට පැවසුවත් මෙවුවක ප්‍රලාපයක් සේ ඔවුන් බැහැර කළා. එහෙත් පේදුරු නැගිට සොහොන් ගැබ කරා ගියා.
ආශ්චර්යක්මයි! ජේසුස් වහන්සේගේ ශ්‍රී වස්ත්‍ර පමණයි මෙහි තිබෙන්නේ.
පසුව පේදුරු හා තවත් ගෝලයෙක් එම්මාවුස්නම් ගමට යමින් සිටියා. මගදී තවත් අමුත්තෙක් ඔවුන්ට හමු වුනා.
නුඹලා කරන කතාන්තරේ කුමක් ගැනද?
නාසරෙත්හි ජේසුස් වහන්සේ පිළිබඳ කාරණයයි
එම අමුත්තා ඔවුන් සමඟ රාත්‍රී නවාතැන් ගත්තා. කෑමට හිඳගත් කල්හි රොටි ගෙන ආශිර්වාදය පවසා කඩා ඔවුන්ට දුන්නා.
එවිට ගෝලයින් ජේසුස් වහන්සේව හඳුනා ගත්තා. එවිට උන්වහන්සේ අතුරුදහන් වුනා.
ඔබට ශාන්තිය වේවා!
ගෝලයින් එකෙනෙහිම නැගිට ජෙරුසෙලමට ගොස් ශ්‍රාවකයින් හා අනෙක් සියලු දෙනාට ස්වාමීන් වහන්සේ උත්ථාන වූ පුවත පවසා සිටියා.

# පුංචි අපේ පාස්කුව

ළමා ප්‍රදීපයෙන් පිදෙන

විශේෂ පාස්කු චිත්‍ර කතාව

සැකසුම : තිළිණ අලහකෝන්

